**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන අරමුදල - 2013**

---

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී රු.1,596,142 ක්වූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා රු.166,411 ක් වූ ආධාර හා අරමුදල් අඩු වීම, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් ඒවා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගලපා තිබුණු රු.10,344,030 ක් වූ අඩමාණ ණය වෙන් කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මූල්‍ය චලනයට බලනොපාන අයිතමයක් ලෙස දක්වා නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ එහෙත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු.3,295,000 ක් වූ මෝටර් වාහන හා රු.350,000 ක් වූ ගොඩනැගිල්ලක් තවදුරටත් අරමුදලේ භාවිතයට ගෙන තිබුණද එහි සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ 07 සිට වර්ෂ 18 ක කාල පරාසයක සිට පැවති රු.21,716,000 ක් වූ ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතියද ඒ සඳහා ප්‍රමාණවත් වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

**2.2.3** **නොසැසඳුණු පාලන ගිණුම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම් ශේෂ 02ක් එම උපලේඛන වල ශේෂයන් සමඟ සැසඳීමේදී එකතුව රු.24,827,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

| ගිණුම් විස්තරය | වටිනාකම | විගණනයට ඉදිරිපත් නොවූ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) සමූපකාර සමිති ණය | 14,056,728 | ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ |
| (ආ) කෘෂි අරමුදල් සමිති ණය | 9,482,737 | |
| (ඇ) සමූපකාර විදුහල් ණය | 2,666,000 | |
| (ඈ) උතුරු නැගෙනහිර සමූපකාර සමිති වෙත ලබාදුන් ලොරි රථ ණය | 19,050,000 | |
| (ඉ) කෘෂි අරමුදල් ශේෂ | 3,001,000 | විස්තරාත්මක උපලේඛන |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට ජංගම වත්කම් යටතේ දක්වා ඇති එකතුව රු.2,411,653 ක් වූ අගරු චෙක්පත් වලට අදාළ ණයගැතියන් හඳුනාගෙන එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ ඇති එකතුව රු.3,183,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා ලැබිය යුතු උසාවි වන්දි වසර 04 සිට වසර 05 ක කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 05 සිට වර්ෂ 08 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු.48,545,999 ක්වූ ණයහිමි ශේෂ 7ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.180,395 ක් වූ රජයේ ගිණුමෙන් ලැබිය යුතු වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවී නොතිබුණි.

(ඉ) වර්ෂ 02 සිට වර්ෂ 07 දක්වා කාල පරාසයක සිට සමූපකාර සමිති හා සංගම් 09 කින් අයවිය යුතුව පවතින රු.3,969,799 ක දායක මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

**2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

---

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති,රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 188 (2) | 2011 වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.300,000 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 169 (2) | 2011 වර්ෂයට අදාළ එකතුව වූ රු.55,809 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුමක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි විමර්ශනයක් සිදුකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 | 2010 වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාල නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉකුත් වූ එකතුව රු.46,650 ක්වූ චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 4.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 4.2 ඡේදය | අරමුදල් සඳහා වෙනම බැංකු ගිණුමක් සහ පොත් පත් පවත්වාගෙන යන්නේ නම් එම ගිණුම් නිතිපතා සසඳා ප්‍රගතිය පිළිබඳව එක් එක් කාර්තුව සඳහා වූ වාර්තා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) 4.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි |

| | |
|---|---|
| (ඇ) 2004 ජූලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | එකතුව රු.289,632,607 ක් වූ අතිරික්ත අරමුදල් අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.4,699,969 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.20,956,651 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,256,682 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා විවිධ ආදායම් රු.5,439,392 කින් අඩුවීම, දායක මුදල් ආදායම රු.9,251,693 කින් අඩුවීම, විදේශීය ගමන් වියදම් හා වෙනත් වියදම් පිළිවෙලින් රු.2,087,230 කින් හා රු.6,780,330 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ බැංකු ජංගම ගිණුමේ ශේෂය සෑම මාසයකම රු.මිලියන 4 සිට රු.මිලියන 100 දක්වා වූ ශේෂයක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණු අතර අතිරික්ත මුදල් හඳුනාගෙන එම මුදල් පොළී ආදායමක් ලැබෙන පරිදි ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට පැවත එන එකතුව රු.141,543 ක්වූ හඳුනා නොගත් බැර ශේෂ 05 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී පැවැත්වූ "ඉසුරු සවිය" ජාතික සමූපකාර දින සැමරුම් උළෙල වෙනුවෙන් 2011 හා 2012 වර්ෂවලදී රු.159,900,000 ක් වැයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද මෙම උළෙලේ කටයුතු වෙනුවෙන් රු.7,886,880 ක් ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලය වෙත ගෙවා තිබුණි. තවද මෙම උළෙලට අදාළ අයවැය ඇස්තමේන්තුව හා යෝජිත

වැඩසටහන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර අදාළ තොරතුරු දෙපාර්තමේන්තුව සතු නොවන බව සමූපකාර කොමසාරිස් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) 1972 අංක 5 දරන සමූපකාර පනතේ 43 (i) රීති මාලාවේ 61 වගන්තිය ප්‍රකාරව සමූපකාර අරමුදලේ මුදල් වැය කළ හැක්කේ සමූපකාර අධ්‍යාපනය, ව්‍යාපෘති ප්‍රචාරක වැඩ, සමූපකාර සමිති වල කළමනාකරණ කාර්යක්ෂමතාවය දියුණු කිරීම, සමූපකාර සමිති වලට උපකාර කිරීම වැනි කාර්යයන් සඳහා වුවද, ඊට පටහැනි කාර්යයන් 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් රු.1,724,912 ක් වැයකර තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4:3 ඡේදය ප්‍රකාරව 2013 මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර තිබුණේ 2014 මාර්තු 20 දින වන අතර 2014 ජූලි 15 දින එම මූල්‍ය ප්‍රකාශන ආපසු දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. නැවත එම මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 17 දින එනම්, මාස 08 ක කාල ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

එකතුව රු.101,920,000 ක් වූ ඇස්තමේන්තුගත මුළු ආදායමට සාපේක්ෂව සත්‍ය මුළු ආදායම රු.36,422,166 ක් වූයෙන් ආදායම් ඇස්තමේන්තුව සියයට 64.26 කින් අධිතක්සේරු කර ඇති බව නිරීක්ෂණය විය.

### 5.3 අභ්‍යන්තර විගණනය

----------------------

අරමුදල වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණද, ඒ අනුව සිදු කරන ලද අභ්‍යන්තර විගණන විමසුම්/වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමසාරිස්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් පරිපාලනය
(ඇ) දායක මුදල් එකතු කිරීම
(ඈ) ණය අයකර ගැනීම
(ඉ) අයවැය පාලනය